**2022.02.11 වන දින පෙ.ව. 09.30 ට හපුතලේ ප්‍රාදේශීය සභාවේ**
**නව සභා රැස්වීම් ශාලාවේදී පැවති**
**හපුතලේ ප්‍රාදේශීය සභා මාසික මහා සභා රැස්වීම් වාර්තාව**

**පැමිණීම**

| | | |
|---|---|---|
| 1. බී. කන්දසාමි මහතා | - | ගරු සභාපති |
| 2. වයි.එම්.නිමල් අමරසිරි මයා | - | ගරු උපසභාපති |
| 3. සෙල්ලයියා සගාදේවන් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 4. ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 5. සවරිමුත්තු ප්‍රභාහර් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 6. මාරප්පන් කන්දසාමි මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 7. එච්.ඒ.ඩී. චාන්දනී මානෙල් කුමාරි මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී |
| 8. කේ.ඒ. චන්දන කිත්සිරි පෙරේරා මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 9. ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 10. එල්.එච්. ඉන්දික සම්පත් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 11. එම්.ඒ. නිල්මිණි චන්ද්‍රකාන්ති මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී |
| 12. ගෝපාලන් මුරුගන් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 13. ඩි. සුදත් අරුණඅංජන මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 14. තංගවේලු මහේන්ද්‍රන් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 15. ජී. ලියෝ කැමිලස් ප්‍රනාන්දු මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 16. ආර්.එම්. අනුලාවතී මල්ලිකා මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී |
| 17. වේලුසාමී එලීල් අරසි මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී |

**01.පසුගිය රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම**

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022.01.13 වන දින පවත්වන ලද මාසික මහ සභාවෙ හි මහ සභා වාර්තාව කියවූවා සේ සළකා සභා සම්මත කිරීම සිදු කරන ලෙස ගරු මූලාසනය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපති වයි.එම්.නිමල් අමරසිරි මහතා විසින් පසුගිය මහ සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ආර්.එම්. අනුලාවතී මල්ලිකා මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - අති විශේෂ - 2022 ජනවාරි මස 10 වැනි සඳුදා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත
5(2)(ආ) වගන්තිය යටතේ නියමය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ)ඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර , රාජ්‍ය සේවා , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය , ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම , මෙම නියමයෙන් මෙහි උප ලේඛනයේ නිරූපිත එක් එක් ප්‍රාදේශීය සභාවේ සභිකයන්ගේ ධූර කාලය අවසන් වන දිනය 2023 මාර්තු මස 19 වන දින දක්වා දීර්ඝ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්
,
රාජ්‍ය සේවා , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.

- ඌව පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරියේ සභාපති විසින් ඉදිරිපත් කර ඇති 2021-12-23 වන දිනෙන් යුත් UPPTSA/CR/19/0200 අංක දරණ ලිපිය

- ඌව පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු , සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික සහ පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය මගින් ලද 2022.01.12 වන දිනැති අංක 6/සැ/5/TRA-2022-1 අංක දරණ ලිපිය

- ඌව පළාත් සභාවේ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය - දියතලාව මගින් ලද 2022.02.07 දිනැති 17/3/7/PL/09/ මාර්ග පොදු අංක දරණ ලිපිය

## 03. සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ප්‍රභාගර් මහතා

- හපුතලේ කහගල්ල වත්තෙ හි පදිංචි එන්. සීලනී මහත්මිය විසින් ද්‍රව්‍යාධාර ලබා ගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලිපිය

2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තංගවේලු මහේන්ද්‍රන් මහතා

- හපුතලේ , තංගමලේ වත්ත, අංක 06 හි පදිංචි ටී. විජේකුමාර් මහතා වැසිකිළියක් ඉදි කර ගැනීම සඳහා සිමෙන්ති මිටි 05ක් ලබා ගැනීම සම්බන්ධයෙන් යොමු කර ඇති ලිපිය

3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ලියෝ කැමිලස් ප්‍රනාන්දු මහතා

- පොලිස්කන්ද - දියතලාව ග්‍රාම සංවර්ධන සමිතිය විසින් පොලිස් කන්ද ගස්වත්ත මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් යොමු කර ඇති ලිපිය

4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගෝපාලන් මුරුගන් මහතා

- 2022 වර්ෂයේ අයවැය යෝජනා - පාසල් ළමුන් සඳහා අවශ්‍ය පාසල් උපකරණ ලබා දීම.

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.**

නැත

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා**

**යෝජනා අංක 01**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) හා (ඔ) වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව විසින් පිහිටවනු ලබන ප්‍රාදේශීය සභා අරමුදලෙන් ප්‍රජාව සඳහා සහන සැලසීම මූලික කරගෙන සිදු කරනු ලබන කාර්යයන් වෙනුවෙන් 2022 වර්ෂය සඳහා ද්‍රව්‍යාධාර ලබා දීම සඳහා එක් සභිකයෙක් නියෝජනය කරන කොට්ඨාසයේ ප්‍රජා ඉල්ලීම්වලට අනුව එක් ඉල්ලීමක් බැගින් ඉටු කිරීම සඳහා රු.10,000.00ක ප්‍රතිපාදන මුදලක් සභා අරමුදලෙන් දැරීම ගරු ආණ්ඩුකාරතුමන්ගේ පූර්ව අනුමැතිය මත සිදු කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා</u>

<u>විවාද</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) හා (ඔ) වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව විසින් පිහිටවනු ලබන ප්‍රාදේශීය සභා අරමුදලෙන් ප්‍රජාව සඳහා සහන සැලසීම මූලික කරගෙන සිදු කරනු ලබන කාර්යයන් වෙනුවෙන් 2022 වර්ෂය සඳහා ද්‍රව්‍යාධාර ලබා දීම සඳහා එක් සභිකයෙක් නියෝජනය කරන කොට්ඨාසයේ ප්‍රජා ඉල්ලීම්වලට අනුව එක් ඉල්ලීමක් බැගින් ඉටු කිරීම සඳහා රු.10,000.00ක ප්‍රතිපාදන මුදලක් සභා අරමුදලෙන් දැරීම ගරු ආණ්ඩුකාරතුමන්ගේ පූර්ව අනුමැතිය මත සිදු කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 02**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

2021-11-02 වන දින පැවති මුදල් කමිටු නිර්දේශය මත කොවිඩ් 19 වසංගත තත්ත්වය මත රජය විසින් ක්‍රියාත්මක කරන ලද සංචරණ සීමා හේතුවෙන් 2021 අගෝස්තු මස හා සැප්තැම්බර් මස රට වසා තැබූ දිනයන් සඳහා අය කළ යුතු පහත උප ලේඛනයේ සඳහන් වූ කඩකුලී රු.54,554.00 ක් එකී පුද්ගලයන්ගේ ඉල්ලීම මත හපුතලේ ප්‍රාදේශීය සභාවේ බදු නිදහස් කිරීමේ නිර්වචිත ප්‍රතිපත්තිය සැලකිල්ලට ගෙන ආදායමෙන් කපා හැරීමටත් එකී ලැබිය යුතු ආදායම වැය විෂය අංක 309/01 යටතේ ගැළපීම සුදුසු බවත් යොජනා කරන්නී ය.

| 2021- අගෝස්තු/සැප්තැම්බර් මාසවල සංචරණ සීමා පැවති කාලය තුළ කපා හැරිය යුතු මුදල් ප්‍රමාණය -කඩකුලී | | | | |
|---|---|---|---|---|
| **දියතලාව නව වෙළඳ සංකීර්ණය බිම් මහළ** | | | | |
| | | **අය විය යුතු මුදල** | **කපා හැරිය යුතු මුදල(අගෝස්තු 21-31 දක්වා** | **සැප්තැම්බර් මාසය** |
| 1 | එෆ්.නන්ද කුමාර මයා,කුමා ට්‍රේඩර්ස්,කෙලින් වීදිය,දියතලාව | 3850 | 1283 | 3850 |
| 2 | එෆ.එම්.ඒ.අසීස් මයා,ජෙස්මින් නිවය,කහගොල්ල,දියතලාව | 3850 | 1283 | 3850 |
| 3 | රුක්මාලී මහේෂා ගුණරත්න මිය,153 ඒ,ශ්‍රී සුදර්ශනාරාම පාර,දියතලාව | 3850 | 1283 | 3850 |
| 4 | ෆාතිමා අස්රා මිය,පොලිස් කන්ද,දියතලාව | 6909 | 2303 | 6909 |
| 5 | අනුර කරුණාරත්න මයා,අංක 01,පොලිස් කන්ද,දියතලාව | 3850 | 1283 | 3850 |
| 6 | එෆ.එම්.ඒ.අසීස් මයා,ජෙස්මින් නිවය,කහගොල්ල,දියතලාව | 3850 | 1283 | 3850 |
| 7 | ජී.පී.ආර්.ලලනි අබේවික්‍රම මිය,චාන්දනී,යහලබැද්ද,හපුතලේ | 3850 | 1283 | 3850 |
| 8 | ඩබ්.ඒ.රත්නපාල මයා,අංක 02,පොල පාර,දියතලාව | 3850 | 1283 | 3850 |
| 9 | ජේ.එම්.සුනේත්‍රා ජයරත්න මිය,තේ වත්තේ ගෙදර,යහල බැද්ද,හපුතලේ | 3850 | 1283 | 3850 |
| 10 | ඩී.එම්.සී.බණ්ඩාර මයා,32/3,කිරිදි ඇල්ල,බණ්ඩාරවෙල | 3209 | 1069 | 3209 |
| | **එකතුව** | **40918** | **13636** | **40918** |
| | | | **54554** | |

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා</u>

<u>විවාද</u>

2021-11-02 වන දින පැවති මුදල් කමිටු නිර්දේශය මත කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් රජය විසින් ක්‍රියාත්මක කරන ලද සංචරණ සීමා හේතුවෙන් 2021 අගෝස්තු මස හා සැප්තැම්බර් මස රට වසා තැබූ දිනයන් සඳහා අය කළ යුතු පහත උප ලේඛනයේ සඳහන් වූ කඩකුලී රු.50,276.00 ක් එකී පුද්ගලයන්ගේ ඉල්ලීම මත හපුතලේ ප්‍රාදේශීය සභාවේ බදු නිදහස් කිරීමේ

නිර්වචිත ප්‍රතිපත්තිය සැලකිල්ලට ගෙන ආදායමෙන් කපා හැරීමටත් එකී ලැබිය යුතු ආදායම වැය විෂය අංක 309/01 යටතේ ගැළපීම සුදුසු බවත් ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

| 2021- අගෝස්තු/සැප්තැම්බර් මාසවල සංචරණ සීමා පැවති කාලය තුළ කපා හැරිය යුතු මුදල් ප්‍රමාණය -කඩකුලී | | | | |
|---|---|---|---|---|
| දියතලාව නව වෙළඳ සංකීර්ණය බිම් මහළ | | | | |
| | | **අය විය යුතු මුදල** | **කපා හැරිය යුතු මුදල(අගෝස්තු 21-31 දක්වා** | **සැප්තැම්බර් මාසය** |
| 1 | එෆ්.නන්ද කුමාර මයා,කුමා ට්‍රේඩර්ස්,කෙලින් වීදිය,දියතලාව | 3850 | 1283 | 3850 |
| 2 | එෆ.එම්.ඒ.අසීස් මයා,ජෙස්මින් නිවය,කහගොල්ල,දියතලාව | 3850 | 1283 | 3850 |
| 3 | රුක්මාලී මහේෂා ගුණරත්න මිය,153 ඒ,ශ්‍රී සුදර්ශනාරාම පාර,දියතලාව | 3850 | 1283 | 3850 |
| 4 | ෆාතිමා අස්රා මිය,පොලිස් කන්ද,දියතලාව | 6909 | 2303 | 6909 |
| 5 | අනුර කරුණාරත්න මයා,අංක 01,පොලිස් කන්ද,දියතලාව | 3850 | 1283 | 3850 |
| 6 | එෆ.එම්.ඒ.අසීස් මයා,ජෙස්මින් නිවය,කහගොල්ල,දියතලාව | 3850 | 1283 | 3850 |
| 7 | ජී.පී.ආර්.ලලනි අබේවික්‍රම මිය,චාන්දනී,යහලබැද්ද,හපුතලේ | 3850 | 1283 | 3850 |
| 8 | ඩබ්.ඒ.රත්නපාල මයා,අංක 02,පොල පාර,දියතලාව | 3850 | 1283 | 3850 |
| 9 | ජේ.එම්.සුනේත්‍රා ජයරත්න මිය,තේ වත්තේ ගෙදර,යහල බැද්ද,හපුතලේ | 3850 | 1283 | 3850 |
| | **එකතුව** | **37709** | **12567** | **37709** |
| | | | **50276** | |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් නම් ලැයිස්තුවේ සඳහන් නම් තෝරා ඇත්තේ සභා පනතට අනුව ද යන්න ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා විසින් අදහස් දක්වමින් ඩී.එම්.සී.බණ්ඩාර මහතාට අයත් කඩකාමරය කොවිඩ් වසංගත තත්ත්වය පැවති කාලය පුරාවටම විවෘත කර තිබූ බවත් ඒ හෙයින් මෙකී තීරණයට විරුද්ධ බවත් ප්‍රකාශ කරන ලදී.

ප්‍රාදේශීය සභා ගරු උපසභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා අදහස් දක්වමින් මේ සියලුම කඩවල් සඳහා උපරිමයෙන් පහසුකම් සපයා දී ඇති බවත් ඒ හේතුවෙන් මෙකී තීරණයට විරුද්ධබවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් මෙකී කඩ පවත්වාගෙන යාම සිදු කරනුයේ කඩහිමියන් විසින් ම නොවන බවත් කඩකුලී ගෙවනු ලබන්නේ කඩ පවත්වාගෙන යනු ලබන්නන් විසින් බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. එසේම ඩී.එම්.සී.බණ්ඩාර මහතා කොරෝනා වසංගත තත්ත්වය හමුවේ ඔහුට අයත් කඩකාමරය විවෘත කර තිබූ හෙයින් ඒ සඳහා පමණක් මෙකී කඩකුලී අයකර ගැනීම සිදු කිරීම සුදුසු ද යන්නත් අනෙකුත් කඩකාමර සඳහා බදු නිදහස් කිරීම සුදුසු ද යන්නත් ගරු සභාවෙන් විමසීම් සිදු කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ඩී.එම්.සී.බණ්ඩාර මහතාට අයත් කඩකාමරය සඳහා පමණක් මෙකී කඩකුලී අයකර ගැනීමත් අනෙකුත් කඩකාමර සඳහා බදු නිදහස් කිරීම සිදු කිරීම සුදුසුය යන්නත් මත ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 03**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

දියතලාව පොදු වෙළඳපොල මාසික ජල බිල්පත ගෙවීම සම්බන්ධයෙන් ජල බිලෙන් 50% ක් කඩහිමියන් විසින් හා ඉතුරු 50% සභාව මගින් ගෙවීමට 2012.08.30 දිනැති සභා තීරණය මත තීරණය කර ඇති අතර කඩහිමියන් විසින් ගෙවිය යුතු 50% ක මුදල සඳහා එක් අයෙකුගෙන් රු.150.00ක මුදලක් ලෙස 2012 සැප්තැම්බර් මාසයේ සිට කඩ කුලිය සමඟ ජල ගාස්තු තැම්පත් ලෙස අය කිරීමට 2012.08.30 වන දින පැවති මහ සභා තීරණ අනුව සභා සම්මත වී මේ වන තෙක් එකී තීරණය පරිදි කටයුතු පවත්වාගෙන ගොස් ඇති අතර මේ වන විට 2012 වර්ෂයට සාපේක්ෂව ඉතා වැඩි වටිනාකමකින් යුතු ජල බිල්පතක් ලැබෙන බැවින් එකී ජල බිල්පත ගෙවීමට මෙලෙස ලැබෙන රු.150*16=2400.00ක මුදල ප්‍රමාණවත් නොවන හෙයින් මෙම ජල බිල්පත ගෙවීම එකී කඩහිමියන් විසින් ම සිදු කිරීම කළ යුතු බව යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. චන්දන කිත්සිරි පෙරේරා මහතා</u>

<u>විවාද</u>

දියතලාව පොදු වෙළඳපොල මාසික ජල බිල්පත ගෙවීම සම්බන්ධයෙන් ජල බිලෙන් 50% ක් කඩහිමියන් විසින් හා ඉතුරු 50% සභාව මගින් ගෙවීමට 2012.08.30 දිනැති සභා තීරණය මත තීරණය කර ඇති අතර කඩහිමියන් විසින් ගෙවිය යුතු 50% ක මුදල සඳහා එක් අයෙකුගෙන් රු.150.00ක මුදලක් ලෙස 2012 සැප්තැම්බර් මාසයේ සිට කඩ කුලිය සමඟ ජල ගාස්තු තැම්පත් ලෙස අය කිරීමට 2012.08.30 වන දින පැවති මහ සභා තීරණ අනුව සභා සම්මත වී මේ වන තෙක් එකී තීරණය පරිදි කටයුතු පවත්වාගෙන ගොස් ඇති අතර මේ වන විට 2012 වර්ෂයට සාපේක්ෂව ඉතා වැඩි වටිනාකමකින් යුතු ජල බිල්පතක් ලැබෙන බැවින් එකී ජල බිල්පත ගෙවීමට මෙලෙස ලැබෙන

රු.150*16=2400.00ක මුදල ප්‍රමාණවත් නොවන හෙයින් මෙම ජල බිල්පත ගෙවීම සම්බන්ධයෙන් සභා තීරණයක් ගැනීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

දියතලාව පොදු වෙළඳපොල මාසික ජල බිල්පත ගෙවීම සම්බන්ධයෙන් එකී කඩහිමි පුද්ගලයින් විසින්ම එකී බිල්පත් ගාස්තුව ගෙවිය යුතු බවට ගරු සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 04**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශිය සභාව විසින් සැකසිය යුතු යැයි හඳුනා ගෙන ඇති පුස්තකාල වෙනත් සේවා සැපයීම , ජංගම වෙළඳසැල් පවත්වාගෙන යාම , විවිධ අයදුම්පත්‍ර ගාස්තු අය කිරීම, රථ වාහන කුලියට දීම, සේවා සඳහා ගාස්තු අය කිරීම, ආදාහනාගාර පවත්වාගෙන යාම , පෙර පාසල් ගාස්තු අය කිරීම, ජංගම වෙළඳසැල් පවත්වාගෙන යාම, වීථි රේඛා ගාස්තු, පරිසර බලපත්‍ර ගාස්තු , ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු අය කිරීම , බල ප්‍රදේශයේ පොදු ස්ථාන නඩත්තුව හා පාලනය යන ක්ෂේත්‍රවලට අදාල අතුරු ව්‍යවස්ථා සැකසීම සුදුසු බවත් අතුරු ව්‍යවස්ථා සැකසීමට අදාලව පහත සාමාජිකයන් ඇතුලුව කමිටුවක් පත් කර ගැනීම සුදුසු බවටත් යෝජනා කරන්නී ය.

| | | |
|---|---|---|
| සභා ලේකම් | - | කේ.එම්.පී. සී.කුලසේකර මිය. |
| කාර්මික නිලධාරි | - | ආනන්ද උපතිස්ස මහතා |
| කලාප භාර විමර්ෂණ නිලධාරි | - | තරිඳු රාජපක්ෂ මහතා |
| විෂය නිලධාරි | - | චන්ද්‍රානී පද්මලතා මිය |
| ආදායම් පරීක්ෂක | - | ගාමිණී සුරනිමල මහතා |

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. චන්දන කිත්සිරි පෙරේරා මහතා

විවාද

හපුතලේ ප්‍රාදේශිය සභාව විසින් සැකසිය යුතු යැයි හඳුනා ගෙන ඇති පුස්තකාල වෙනත් සේවා සැපයීම , ජංගම වෙළඳසැල් පවත්වාගෙන යාම , විවිධ අයදුම්පත්‍ර ගාස්තු අය කිරීම, රථ වාහන කුලියට දීම, සේවා සඳහා ගාස්තු අය කිරීම, ආදාහනාගාර පවත්වාගෙන යාම , පෙර පාසල් ගාස්තු අය කිරීම, ජංගම වෙළඳසැල් පවත්වාගෙන යාම, වීථි රේඛා ගාස්තු, පරිසර බලපත්‍ර ගාස්තු , ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු අය කිරීම , බල ප්‍රදේශයේ පොදු ස්ථාන නඩත්තුව හා පාලනය යන ක්ෂේත්‍රවලට අදාල අතුරු ව්‍යවස්ථා සැකසීම සුදුසු බවත් අතුරු ව්‍යවස්ථා සැකසීමට අදාලව පහත සාමාජිකයන් ඇතුලුව කමිටුවක් පත් කර ගැනීම සුදුසු බවටත් ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

| | | |
|---|---|---|
| සභා ලේකම් | - | කේ.එම්.පී. සී.කුලසේකර මිය. |
| කාරිමික නිලධාරි | - | ආනන්ද උපතිස්ස මහතා |
| කලාප භාර විමර්ෂණ නිලධාරි- | | තරිඳු රාජපක්ෂ මහතා |
| විෂය නිලධාරි | - | චන්ද්‍රානී පද්මලතා මිය |
| ආදායම් පරීක්ෂක | - | ගාමිණී සුරනිමල මහතා |

ගරු සභාපතිතුමන් අදහස් දක්වමින් ලිප්ටන් ෂීට් සඳහා ඇතුලුවීමට විදේශිකයන් සඳහා රු.500ක් මෙන්ම තේ කර්මාන්ත ශාලාව නැරඹීම සඳහා රු.1000 ක මුදලක් මෙන්ම ඒ ඒ අවස්ථාවන් සඳහා එකී කටයුතුවල නිරත වන පුද්ගලයන්ගේ කැමැත්ත මත සිතු සේ මුදල් අය කරන බවත් , අලෙවිසැල් හි විකුණන ලද ආහාරපාන විවිධ මිල ගණන් යටතේ අලෙවිකරන බවත් , වැසිකිළි සඳහා විවිධ මිල ගණන් අය කරන බවත් , මේ හේතුවෙන් ලිප්ටන් ෂීට් නැරඹීම සඳහා පැමිණෙන දේශීය මෙන්ම විදේශික පුද්ගලයන් බොහෝ අසීරුතාවයකට මුහුණ දෙන බවත් වැඩිකල් නොගොස් ප්‍රාදේශීය ජනතාවට ආදායම් උත්පාදනය කරනු ලැබූ සියලු ආදායම් මාර්ග විනාශ වී යන බවත් ,ලිප්ටන් ෂීට් හි කඩකාමරයක් ලක්ෂ 17 ක වැනි මිලකට වර්ෂයකට ටෙන්ඩර් දමා ඇති බවත් , ලිප්ටන් ෂීට් හි ඉහළ ප්‍රදේශයේ කඩකාමර 06 ක් ඉදි කරන බවත් ඒවාද සුලු පිරිසකට අවශ්‍ය පරිදි ටෙන්ඩර් කරන බවත් මිට පිළියමක් ලෙස හපුතලේ ප්‍රාදේශිය සභාව විසින් අතුරු ව්‍යවස්ථා සකසා ලිප්ටන් ෂීට් හි පාලනය සභාව සතු කර එහි සිදු වන අයථා මිල ගණන් අය කිරීමේ කටයුතු පාලනය සිදු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ර්.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා අදහස් දක්වමින් ලිප්ටන් ෂීට් හි ආහාර මිල ගණන්වල පාලනයක් සිදු කල යුතු බවත් ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේදී ද රු.30.00ක් හා විදේශීකයන්හට රු.500.00 ක් ලෙස මිල ගණන් වල විශාල පරතරයක් ඇති බවත් පාලනයක් සිදු නොකළහොත් විශාල ගැටලුවකට මුහුණ දීමට සිදු වන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මහතා අදහස් දක්වමින් මෙකී ස්ථානය සංචාරක අමාත්‍යාංශයේ ලියාපදිංචි වී තිබේද යන්න විමසන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් මෙකී ස්ථානය සංචාරක අමාත්‍යාංශයේ ලියාපදිංචි වී නොමැති බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා අදහස් දක්වමින් දඹේතැන්න මාර්ගය ඉදිරියේ දී කාපට් කරන බැවින් ප්‍රාදේශීය සභා සභාපතිතුමන්හට ඇති පනතේ සඳහන් බලතල යටතේ සුදුසු පරිදි කටයුතු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ලියෝ කැමිලස් ප්‍රනාන්දු මහතා අදහස් දක්වමින් ලිප්ටන් ෂීට් , ඇඩිසම් බංගලාව හා ෆොක්ස් හීල් හි මෙවැනි අසාධාරණ කටයුතු සිදු වන බවත් මෙම අකටයුතුකම් වැළැක්වීම සඳහා නිරීනීත තීරණයක් ගත යුතු බවත් ඒ වෙනුවෙන් ගරු සභිකයන්ගේ සහයෝගය ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා විසින් අදහස් දක්වමින් හපුතලේ පිහිටි ඇඩිසම් බංගලාව පෞද්ගලික ආයතනයක් බැවින් එයට බලපෑම් කල නොහැකි බවත් ලිප්ටන් ෂීට්

හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවට අයත් කොටස දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට යොමු කර මේ වන විට නිරවුල් කර ගෙන ඇති බවත් එසේම හපුතලේ ප්‍රාදේශීය සභාව මැදිහත් වී දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට හෝ යොමු කර ලිප්ටන් ෂීට් සම්බන්ධයෙන් තීරණයක් ගත යුතු බවත් වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. කන්දසාමි මහතා විසින් අදහස් දක්වමින් මේ වන විට ලිප්ටන් ෂීට් හි නඩත්තු කටයුතු සිදු කරන පාර්ශවයන් විසින් දඹෙතැන්න කොට්ඨාසයෙහි ජීවත් වන ප්‍රජාවට ඒ හරහා සහන ලබා දෙන බවත් ලිපිටන් ෂීට් හි පාලනය සභාව සතුවුව හොත් එකී ප්‍රජාව වෙත ලැබෙන සහනය කුමක්දැයි විමසන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා විසින් අදහස් දක්වමින් දඹෙතැන්න වසමෙ හි කලාප 05ක් ඇති බවත් වත්තේ පිරිසක් විසින් කමිටුවක් පත් කර ගෙන මෙකී මිල ගණන් තීරණය කරනු ලබන බවත් සභාව හරහා තීරණයක් ගෙන කඩ කිහිපයක් සභාවට පවරා ගැනීම සුදුසු බවත් සභාව මගින් ජංගම සේවයක් ආරම්භ කිරීම සුදුසු බවටත් යෝජනාවක් සිදු කරන බව ප්‍රකාශ කරන ලදී. එසේ ම අතුරු ව්‍යවස්ථා කමිටුවෙ හි සාමාජිකත්වය සඳහා ගරු මහජන නියොජිතයන්ගේ නියෝජනයක් සිදු නොවන්නේ ද යන්න විමසන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මහතා අදහස් දක්වමින් කඩ කිහිපයක් සභාවට පවරා ගැනීම සඳහා එකී කටයුතු වල නිරත වන පුද්ගලයන් විසින් ඉඩ ලබා දීම සිදු කරයි ද යන්න විමසන ලදී.

ගරු සභාපතිතුමන් විසින් අදහස් දක්වමින් අතුරු ව්‍යවස්ථා කමිටුවට මහජන නියොජිතයන්ගේ නියෝජනයක් සිදු නොවන බවත් පොදුවේ මේ පිලිබඳව සලකා බලා සභාවට පවරා ගන්නේ ද නැද්ද යන්නත් මෙහි සිදු වන මිල ගණන් ඉහල දැමීමට විරුද්ධව දැඩිව පියවර ගත යුතු බවත් විදේශිකයන්හට සහන ලබා දීම කටයුතු කළ යුතු බවත් ඒ සඳහා අතුරු ව්‍යවස්ථා සකසා ඒ වෙනුවෙන් කටයුතු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා විසින් අදහස් දක්වමින් සභාව මගින් සුභසාධක අලෙවිසැලක් ආරම්භ කිරීම් සුදුසු බව ප්‍රකාශ කළ අතර ගරු සභාපතිතුමන් විසින් අදහස් දක්වමින් එසේ කලහොත් සුළු පරිමාණ අලෙවිකරුවන්ට ගැටලුවක් වන බැවින් එසේ නොකළ හැකි බවත් එහි පවත්වාගෙන යනු ලබන අලෙවිසැල් හි මිල කැඳවීම් 2022-08 වන මාසයෙන් අවසන් වන බැවින් ඉන් පසු මේ පිලිබඳව ඉදිරි පියවර ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා විසින් අදහස් දක්වමින් මේ වසරේ එකී පුද්ගලයන් හට ජීවත් වීමට ඉඩ ප්‍රස්ථාව ලබා දී 2023 වර්ෂයේ කෙසේ හෝ සභාවට පවරා ගැනීම සඳහා අතුරු ව්‍යවස්ථා සැකසීම සුදුසු බවත් ප්‍රකාශ කල අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. ඉංදික සම්පත් මහතාද අදහස් දක්වමින් ප්‍රායෝගිකව කටයුතු සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. කන්දසාමි මහතා ලිප්ටන් ෂීට් හපුතලේ ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සඳහා අතුරු ව්‍යවස්ථා සැකසීම යෝජනාව සම්බන්ධයෙන් විරුද්ධත්වය ප්‍රකාශ කළ අතර සෙසු ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව බහුතර එකඟතාවය මත සභා සම්මත විය.

**යෝජනා අංක 05**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යනු ලබන පාරවල් සහ පටු මංමාවත්වල ස්ථිර සලකුණු සහ සීමා ලකුණු කිරීමද එම පාරවල්වල සහ පටු මංමාවත්වල සැලස්මවල් පිළියෙල කිරීමට කටයුතු සැලැස්වීම ද , එම පාරවල්වල සහ පටු මංමාවත්වල නාමලේඛනයක් දක්වමින් නියෝගවල නියම කර ඇති ආකාරයට දැන්වීම් පළ කිරීමට කටයුතු සැළැස්වීම ද සෑම ප්‍රාදේශීය සභාවකම කාර්යයක් විය යුතු බැවින් 2022-03-01 දින සිට 2024-12-31 දින දක්වා හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් මාර්ගයන්හි එකී කටයුතු සිදු කිරීම සුදුසු කාලය ලෙස ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා

විවාද

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යනු ලබන පාරවල් සහ පටු මංමාවත්වල ස්ථිර සලකුණු සහ සීමා ලකුණු කිරීමද එම පාරවල්වල සහ පටු මංමාවත්වල සැලස්මවල් පිළියෙල කිරීමට කටයුතු සැලැස්වීම ද , එම පාරවල්වල සහ පටු මංමාවත්වල නාමලේඛනයක් දක්වමින් නියෝගවල නියම කර ඇති ආකාරයට දැන්වීම් පළ කිරීමට කටයුතු සැළැස්වීම ද සෑම ප්‍රාදේශීය සභාවකම කාර්යයක් විය යුතු බැවින් 2022-03-01 දින සිට 2024-12-31 දින දක්වා හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් මාර්ගයන්හි එකී කටයුතු සිදු කිරීම සුදුසු කාලය ලෙස ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කර දෙන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**මහ සභාව කාරක සභාවක් බවට යෝජනා කිරීම.**

යෝජනා කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා

**කාරක සභාව මහ සභාවක් බවට යෝජනා කිරීම.**

යෝජනා කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා

## යෝජනා අංක 06

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන ( සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වන වගන්තිය යටතේ පළාත් පාලන නිවාස හා ඉදි කිරීම් අමාත්‍යතුමා විසින් සාදනු ලැබූ 1988.08.23 දින අංක 520/07 දරණ සම්මත අතුරු ව්‍යවස්ථාවේ 9,14,19,20,21,28,33,36,38 හා 39 අතුරු ව්‍යවස්ථා පරිච්ඡින්න කර , 1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන ( සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වන වගන්තිය යටතේ ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය, අධ්‍යාපන පළාත් පාලන සංස්කෘතික කටයුතු , ප්‍රවාහන, ඉඩම්, වාරිමාර්ග, ආර්ථික ප්‍රවර්ධන හා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ ඇමතිතුමා විසින් සාදනු ලැබූ 2013.06.28 දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ iv(අ) කොටසේ පලකරන ලද්දා වූ පොදු අතුරු ව්‍යවස්ථාවල අංක 01 සිට 23 දක්වා වූ බාණ්ඩ, එකී අතුරු ව්‍යවස්ථාවේ 02 වන වගන්තියේ (03) වන උප වගන්තියේ විධිවිධාන වලට යටත්ව පිලිගැනීමට හපුතලේ ප්‍රාදේශීය සභාව තීරණය කර ඇති බවත් එකී තීරණය පරිදි අදාල විධිවිධාන හපුතලේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ පනවා ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්.ඒ.ඩී. චාන්දනී මානෙල් කුමාරි මහත්මිය

විවාද

1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන ( සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වන වගන්තිය යටතේ පළාත් පාලන නිවාස හා ඉදි කිරීම් අමාත්‍යතුමා විසින් සාදනු ලැබූ 1988.08.23 දින අංක 520/07 දරණ සම්මත අතුරු ව්‍යවස්ථාවේ 9,14,19,20,21,28,33,36,38 හා 39 අතුරු ව්‍යවස්ථා පරිච්ඡින්න කර , 1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන ( සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වන වගන්තිය යටතේ ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය, අධ්‍යාපන පළාත් පාලන සංස්කෘතික කටයුතු , ප්‍රවාහන, ඉඩම්, වාරිමාර්ග, ආර්ථික ප්‍රවර්ධන හා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ ඇමතිතුමා විසින් සාදනු ලැබූ 2013.06.28 දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ iv(අ) කොටසේ පලකරන ලද්දා වූ පොදු අතුරු ව්‍යවස්ථාවල අංක 01 සිට 23 දක්වා වූ බාණ්ඩ, එකී අතුරු ව්‍යවස්ථාවේ 02 වන වගන්තියේ (03) වන උප වගන්තියේ විධිවිධාන වලට යටත්ව පිලිගැනීමට හපුතලේ ප්‍රාදේශීය සභාව තීරණය කර ඇති බවත් එකී තීරණය පරිදි අදාල විධිවිධාන හපුතලේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ පනවා ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් ගරු මූලාසනය විසින් පැහැදිලි කර දෙන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 07**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

දියතලාව යුධ හමුදා කඳවුරු පරිශ්‍රයේ ෆොක්ස්හිල් වන වගාවේ හෙක්ටයාර 42.0 ක පිහිටි පයිනස් ගස් 23,348 ක ප්‍රමාණය කඩිනමින් කපා ඉවත් කර ගැනීමේ අවශ්‍යතාවය මත එකී දැව ප්‍රවාහනය සඳහා මැණික්කන්ද / අඹේගොඩ මාර්ගය භාවිතය සඳහා අනුමැතිය ලබා දෙන ලෙසට රාජ්‍ය දැව සංස්ථාව මගින් කරන ලද ඉල්ලීම ප්‍රකාරව අදාල මාර්ග කොටස යොදා ගැනීමේ දී යම් හෙයකින් ගල් ඇතිරූ මාර්ග කොටස සඳහා හානි සිදු වුවහොත් එම කොටස පවත්නා තත්ත්වයෙන්ම ඉදිරියට පවත්වාගෙන යාමට හැකි වන පරිදි අලුත්වැඩියා කර දීමේ වගකීමට යටත්ව ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. චන්දන කිත්සිරි පෙරේරා මහතා

විවාද

දියතලාව යුධ හමුදා කඳවුරු පරිශ්‍රයේ ෆොක්ස්හිල් වන වගාවේ හෙක්ටයාර 42.0 ක පිහිටි පයිනස් ගස් 23,348 ක ප්‍රමාණය කඩිනමින් කපා ඉවත් කර ගැනීමේ අවශ්‍යතාවය මත එකී දැව ප්‍රවාහනය සඳහා මැණික්කන්ද / අඹේගොඩ මාර්ගය භාවිතය සඳහා අනුමැතිය ලබා දෙන ලෙසට රාජ්‍ය දැව සංස්ථාව මගින් කරන ලද ඉල්ලීම ප්‍රකාරව අදාල මාර්ගයෙන් කොටසක් හා යුධ හමුදා කඳවුරු මාර්ගයෙන් කොටසක් යොදා ගනිමින් දැව ප්‍රවාහන කටයුතු සිදු කර ගන්නා ලෙස රාජ්‍ය දැව සංස්ථාවට දැන්වුව ද පුහුණු කටයුතු පැවැත්වීම හේතුවෙන් යුධ හමුදා කඳවුරු මාර්ගයෙන් කොටසක් ලබා දීම සිදු කළ නොහැකි බව දන්වා ඇති බැවින් සභායට අයත් මාර්ගය ලබා දෙන ලෙසත් යම් හෙයකින් ගල් ඇතිරූ මාර්ග කොටස සඳහා හානි සිදු වුවහොත් එම කොටස පවත්නා තත්ත්වයෙන්ම ඉදිරියට පවත්වාගෙන යාමට හැකි වන පරිදි අලුත්වැඩියා කර දීමේ වගකීමට යටත්ව සභාව මගින් ලක්ෂ 10ක පමණ හෝ ඇප තැම්පතුවකට යටත්ව ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදි.

ප්‍රාදේශීය සභා ගරු උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා අදහස් දක්වමින් මෙම මාර්ගය තමාගේ කොට්ඨාසයට අයත් මාර්ගයක් බවත් මේ වන විට මෙම මාර්ගයෙන් කොටසක් කාපට් කිරීමට ආරම්භ කර ඇති බවත් 2022 වර්ෂයේ සංවර්ධන යෝජනා යටතේ තමා විසින් මෙකී මාර්ගය සංවර්ධනය සිදු කිරීම සඳහා රු.275,000.00ක් යොදා ඉදිරි සංවර්ධන කටයුතු සිදු කරන බවත් 2022 දී කිලෝමීටර 06 කාපට් කිරීමට නියමිත බවත් මෙකී මාර්ගය ඉතා පටු මාර්ගයක් බැවින් වාහන එහා මෙහා මාරු වීමේදීද බොහෝ අසීරු බවත් මැණික් කන්ද බෝධිය අසළ සිට පරදෙනිඅරාවට ප්‍රමාණයෙන් විශාල ලොරි මාර්ගයේ ගමන් කළ නොහැකි බවත් . බෑවුම සහිත මාර්ගයක් බැවින් දැව ප්‍රවාහන කටයුතු අවධානම් බවත් ප්‍රකාශ කළ අතර මෙලෙස විශාල දැව ප්‍රමණයක් ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් තමාගේ දැඩි විරුද්ධතාවය ප්‍රකාශ කරන බවත් විකල්ප මාර්ගයක් භාවිතා කරන ලෙසත් යුධ හමුදා කඳවුර හරහා ඇල්ල වැව ඇති ස්ථානයට ප්‍රධාන මාර්ගයක් ඇති බවත් සඳහන් කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. ඉංදික සම්පත් මහතා අදහස් දක්වමින් පයිනස් ගස් 23,348 ක ප්‍රමාණය ඉවත් කර ගැනීමේ දී එකී දැව ප්‍රවාහනය සඳහා මැණික්කන්ද / අඹේගොඩ මාර්ගය භාවිතය සිදු කරන්නේ නම් එලෙස සිදු කිරීම කිසිසේත් නුසුදුසු බවත් මෙකී මාර්ගය ඉතා පටු මාර්ගයක් බැවින් දැව පටවා ගන්නා ලද ලොරි රථ ගමන් කිරීමේදී මාර්ගය භාවිතා කරන්නන් හට බොහෝ ගැටලුවලට මුහුණ දීමට සිදු වන බවත් මෙය දීර්ඝ කාලීනව මාස 07ක් පමණ සිදු වන ක්‍රියාවක් බැවින් මෙයට පිළියමක් ලෙස විකල්ප මාර්ගයක් ඉදි කර ගැනීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා අදහස් දක්වමින් දියතලාව යුධ හමුදා කඳවුරු පරිශ්‍රයේ ෆොක්ස්හිල් වන වගාවේ දැව ප්‍රවාහනය සඳහා එකී භූමිය හරහා මාර්ගයක් ඉදි කර ගන්නා ලෙස ප්‍රකාශ කළ අතර මැණික්කන්ද / අඹේගොඩ මාර්ගය භාවිතය සඳහා තමා විරුද්ධ බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණඅංජන මහතා අදහස් දක්වමින් මෙකී මාර්ගය පටු මාර්ගයක් බැවින් වාහන හැසිරවීම අපහසු බවත් ෆොක්ස් හිල් තරඟ පවත්නා සමයේ ඇල්ල ප්‍රදේශයෙන් විශාල වාහන ප්‍රමාණයක් රැගෙන යා හැකි නම් දැව පටවා ගත් වාහනද එම මාර්ගයේම ගෙන යාමට කටයුතු සිදු කරන ලෙසත් නොඑසේ නම් දියතලාව යුධ හමුදා කඳවුරු පරිශ්‍රයේ ෆොක්ස්හිල් වන වගාවේ පයිනස් ගස් පිහිටි භූමිය හරහා දැව ප්‍රවාහනය සඳහා විකල්ප මාර්ගයක් ඉදි කර ගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මහතා අදහස් දක්වමින් මාර්ගය ලබා දීම සම්බන්ධයෙන් මැණික්කන්ද ප්‍රජාවගේ අදහස් විමසුවේ නම් කිසිසේත් මීට එකඟ නොවන බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. ලියෝ කැමිලස් ප්‍රනාන්දු මහතා අදහස් දක්වමින් පසුගිය දිනක විදේශීකයන් මෙන්ම දේශිකයන් බොහෝ දෙනෙකු පැමිණ දියතලාව යුධ හමුදා කඳවුරු පරිශ්‍රයේ ෆොක්ස්හිල් පිහිටි භූමිය නිරීක්ෂණය කිරීම සිදු කළ බවත් විශාල සංවර්ධන කටයුත්තක් සිදු කිරීමට සූදානම් වන බවක් එය දුටු විට තමාට හැගුණු බවත් ප්‍රකාශ කළ අතර මෙකී මාර්ගය ඉතා පටු මාර්ගයක් බැවින් වාහන එහා මෙහා මාරු වීමේදීද බොහෝ අසීරු බවත් බෑවුම සහිත දැඩි අවධානම් සහිත මාර්ගයක් බැවින් දැව ප්‍රවාහන කටයුතු අවධානම් බවත් ප්‍රකාශ කළ අතර මෙලෙස විශාල දැව ප්‍රමණයක් ප්‍රවාහනය කිරීම කිසිසේත් නුසුදුසු බවත් ඒ සඳහා විකල්ප මාර්ගයක් භාවිතා කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, දියතලාව යුධ හමුදා කඳවුරු පරිශ්‍රයේ ෆොක්ස්හිල් වන වගාවේ හෙක්ටයාර 42.0 ක පිහිටි පයිනස් ගස් 23,348 ක ප්‍රමාණය කඩිනමින් කපා ඉවත් කර ගැනීමේ අවශ්‍යතාවය මත එකී දැව ප්‍රවාහනය සඳහා මැණික්කන්ද / අඹේගොඩ මාර්ගය භාවිතය සඳහා අනුමැතිය ලබා නොදුන් අතර යුධ හමුදා කඳවුර හරහා විකල්ප මාර්ගයක් ඉදි කර ගන්නා ලෙසත් තීරණය වූ බැවින් ගරු මන්ත්‍රී මණ්ඩලයේ සභිකයන් බොහෝ දෙනෙකුගේ විරෝධතාවය මත එකී යෝජනාව ප්‍රතික්ෂේප වූ අතර සභා සම්මත නොවී ය.

**යෝජනා අංක 08**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

ජාතික වටිනාකමකින් යුතු පොදු නිවාඩු දිනයන් සඳහා පොළ බදු හා වාහන බදු අය කිරීමට අපහසු වන බැවින් කුලී මුදල් අය කර නොගන්නා ලෙස එකී කටයුතුවල නිරත පුද්ගලයින් විසින් අඛණ්ඩව ඉල්ලීම් සිදු කරන බැවින් 2022 වර්ෂයෙහි ඇති ජාතික වටිනාකමකින් යුතු පොදු නිවාඩු දිනයන් සඳහා හපුතලේ ප්‍රාදේශීය සභාවේ පොළ බදු හා වාහන බදු කුලී මුදල් අයකර නොගැනීම සම්බන්ධයෙන් මහ සභා තීරණයක් ලබා ගැනීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. චන්දන කිත්සිරි පෙරේරා මහතා

විවාදය

ජාතික වටිනාකමකින් යුතු පොදු නිවාඩු දිනයන් සඳහා පොළ බදු හා වාහන බදු අය කිරීමට අපහසු වන බැවින් කුලී මුදල් අය කර නොගන්නා ලෙස එකී කටයුතුවල නිරත පුද්ගලයින් විසින් අඛණ්ඩව ඉල්ලීම් සිදු කරන බැවින් 2022 වර්ෂයෙහි ඇති ජාතික වටිනාකමකින් යුතු පොදු නිවාඩු දිනයන් සඳහා හපුතලේ ප්‍රාදේශීය සභාවේ පොළ බදු හා වාහන බදු කුලී මුදල් අයකර නොගැනීම සම්බන්ධයෙන් මහ සභා තීරණයක් ලබා ගැනීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා අදහස් දක්වමින් පොළ බදු අය කිරීමේ දී එකී ගිවිසුම් ප්‍රකාරව සුවිශේෂී දිනයන් සඳහා ප්‍රතිලාභ ලබා දී තිබිය දී මෙලෙස කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා බැලිය යුතු බවත් ඊට අමතරව යෙදෙන ජාතික වටිනාකමකින් යුතු පොදු නිවාඩු දිනයන්හිදී බොහෝ සෙයින් වාහන නගරය තුළට ඇදී එන බවත් විශාල වාහන ප්‍රමාණයක් නගරය තුළ සැරිසරණ බැවින් පොළ බදු හා වාහන බදු රැස් කිරීම සිදු කර සභාවට ආදායමක් උත්පාදනය කළ හැකි බැවින් පොදු නිවාඩු දිනයන් සඳහා පොළ බදු හා වාහන බදු අය කර නොගන්නා ලෙස මහ සභා තීරණයක් ලබා ගැනීම නුසුදුසු බවත් අවශ්‍ය අවස්ථාවන් හිදී සුදුසු ද යන්න තීරණය කර එකී කටයුතු වල නිරත වන පුද්ගලයන්ගේ ලිඛිත ඉල්ලීම මත එකී ඉල්ලීම් මුදල් කමිටුවට යොමු කිරීමෙන් අනතුරුව අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. ලියෝ කැමිලස් ප්‍රනාන්දු මහතා අදහස් දක්වමින් අලුතෙන් ඉදි කරනු ලබන පොළ භූමියෙ හි ඉදි කිරීම් කටයුතු අවසන් වූ පසු දියතලාව නගරය තුළ අලෙවිසැල් , බැංකු ආදී සියලුම ආයතනයන් හි ඉදිරිපිට නතර කර ඇති වාහන සියල්ලම එකී පොළ භූමියෙ හි නතර කිරීමට අවශ්‍ය කටයුතු සිදු කල යුතු බවත් අලෙවිසැල්හිමියන් හා බැංකු නිලධාරීන්ගේ වාහන එකී ආයතන ඉදිරිපිට නතර කිරීම සිදු කිරීම හේතුවෙන් නගරය තුළ දැඩි රථවාහන තදබදයක් සිදු වන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, අදාළ බදුකරු විසින් ඉල්ලීම් කරන අවශ්‍යතාවය සලකා බලා මුදල් කමිටු නිර්දේශය හෝ සභා නිර්දේශය මත ඉල්ලීම් පිළිබද අවස්ථානුකූලව තීරණ ලබා දීම සුදුසු බවට ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## යෝජනා අංක 09

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

2021 වර්ෂයේ පොදු අරමුදල් යටතේ අනුමත කරන ලද කර්මාන්ත කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ සහ වත්මන් ආර්ථිකය තුළ භාණ්ඩ මිල සීග්‍රයෙන් උච්චාවචනය වීම මෙන්ම වෙළඳපොළෙහි පවතින භාණ්ඩ හිඟතාවය හේතුවෙන් සහා අරමුදලින් එකී අනුමත කරන ලද කාර්යයන් ඉටු කිරීමට නොහැකි වූ බැවින් 2022 වර්ෂයේ ණයගිමි ලෙස යොදා ඇති අතර එකී පහත සඳහන් කර්මාන්ත අනුමත මුදලට යටත්ව හා නව ඒකක මිල ගණන් අනුව සකස් කර ඉදිරියට කටයුතු කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම සුදුසු බව යෝජනා කරන්නී ය.

| කමිටු යෝජනා දිනය | කමිටු යෝජනා අංකය | යෝජනා අංකය සහ යෝජනාව | මුදල රු |
|---|---|---|---|
| 2021-04-05 | 18 | කහගොල්ල පංසල අසල පාර සිට අම්පිටිගොඩ දක්වා මාර්ගය සංවර්ධනය කිරීම | 200,000.00 |
| 2021-06-02 | 7 | ග්ලැනනෝර් අංක 06 පඩිපෙළ අලුත්වැඩියාව | 129,814.72 |
| 2021-07-02 | 11 | ග්ලැනනොර් අංක 22 බෝක්කුව වැඩිදියුණු කිරීම( කෝවිල අසල බෝක්කුව) | 98,000.00 |
| 2021-12-06 | 13 | කහගොල්ල වැල්ගොල්ල මාර්ගයේ බෝක්කුව සමඟ කාණු පද්ධතිය සංවර්ධනය | 201,597.25 |
| 2021-12-06 | 14 | පංකැටිය රොහැම්ටන් ක්‍රිස්තියානි පල්ලියේ ගේට්ටුව සංවර්ධනය කිරීම. | 116,247.00 |

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා

විවාද

2021 වර්ෂයේ පොදු අරමුදල් යටතේ අනුමත කරන ලද කර්මාන්ත කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ සහ වත්මන් ආර්ථිකය තුළ භාණ්ඩ මිල සීග්‍රයෙන් උච්චාවචනය වීම මෙන්ම වෙළඳපොළෙහි පවතින භාණ්ඩ හිඟතාවය හේතුවෙන් සහා අරමුදලින් එකී අනුමත කරන ලද කාර්යයන් ඉටු කිරීමට නොහැකි වූ බැවින් 2022 වර්ෂයේ ණයගිමි ලෙස යොදා ඇති අතර එකී පහත සඳහන් කර්මාන්ත අනුමත මුදලට යටත්ව හා නව රේට් අනුව සකස් කර ඉදිරියට කටයුතු කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

| කම්ටු යෝජනා දිනය | කම්ටු යෝජනා අංකය | යෝජනා අංකය සහ යෝජනාව | මුදල රු |
|---|---|---|---|
| 2021-04-05 | 18 | කහගොල්ල පංසල අසල පාර සිට අම්පිටිගොඩ දක්වා මාර්ගය සංවර්ධනය කිරීම | 200,000.00 |
| 2021-06-02 | 7 | ග්ලැනනෝර් අංක 06 පඩිපෙළ අලුත්වැඩියාව | 129,814.72 |
| 2021-07-02 | 11 | ග්ලැනනොර් අංක 22 බෝක්කුව වැඩිදියුණු කිරීම( කෝවිල අසල බෝක්කුව) | 98,000.00 |
| 2021-12-06 | 13 | කහගොල්ල වැල්ගොල්ල මාර්ගයේ බෝක්කුව සමඟ කාණු පද්ධතිය සංවර්ධනය | 201,597.25 |
| 2021-12-06 | 14 | පංකැටිය රොහැම්ටන් ක්‍රිස්තියානි පල්ලියේ ගේට්ටුව සංවර්ධනය කිරීම. | 116,247.00 |

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකගතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකගතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 10**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2021-12-31න් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා

විවාද

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2021-12-31න් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකගතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකගතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## යෝජනා අංක 11

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

ප්‍රාදේශීය සභා සභාපති වෙත මහජනතාවගේ පොදු සෞඛ්‍ය කටයුතු ඉටු කිරීමෙහි ලා මූලික නීතියට අමතරව ආහාර පනත , ගව ඝාතක ආඥා පනත ආදි පනත් මගින් පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම සඳහා මහජන සෞඛ්‍යයට අදාල කරුණු සම්බන්ධයෙන් වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී , ඒ ප්‍රාදේශීය සභාව, එහි සීමා ඇතුළත වූ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විමසා ක්‍රියාත්මක කළ යුතු බවත් එවැනි සියලු කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් දීම ද මහජන සෞඛ්‍යයට අදාළ කටයුතු ඒ ප්‍රදේශය තුළ කරගෙන යාම විධාන කිරීම හා අධීක්ෂණය ද ඒ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයාගේ වගකීම විය යුතු බවත් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ iv වන කොටස 78(1) හා (2)වගන්තිය ප්‍රකාරව සඳහන් වී ඇති බැවින් මෙකී කාර්යය නෛතිකව ඉටු කර ගැනීම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි ඇතුලු කාර්ය මණ්ඩලය සභාවට අයත් කාර්ය මණ්ඩලයක් ලෙස සලකා කටයුතු කිරීම සුදුසු බව යෝජනා කරන අතර පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් යොමු කරන ලද PL/10/04/01/20221(sub) හා 2021.11.19 දිනැති ලිපිය මගින් දන්වා ඇති පරිදි පහත සඳහන් පරිදි ප්‍රාදේශීය සභා පනතට යෝජිත සංශෝධන (216 හා 226 වගන්ති ) අනුව

01. මහජන සෞඛ්‍යයට අදාළ එහි නෛතික බලතල ප්‍රදේශයේ මහජන සෞඛ්‍යයට අදාළව එහි නෛතික බලතල ප්‍රදේශයේ අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා වෙත පැවරීම ප්‍රාදේශීය සභාවට නීත්‍යානුකූල වේ.

02. ප්‍රාදේශීය සභා පනතේ **සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි** යන්නෙන් අදහස් වන්නේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ නම් කරන ලද සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි හෝ අතිරේක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තනතුරට පත් කරන ලද ඕනෑම නිලධාරියෙකු හෝ එම තනතුරේ සේවය කරන ඕනෑම වෛද්‍ය නිලධාරියෙකු වේ.

යන සංශෝධනයන් පිළිගැනීම සුදුසු ද නොමැති ද යන තීරණය කිරීම සුදුසු බවත් යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා

විවාද

ප්‍රාදේශීය සභා සභාපති වෙත මහජනතාවගේ පොදු සෞඛ්‍ය කටයුතු ඉටු කිරීමෙහි ලා මූලික නීතියට අමතරව ආහාර පනත , ගව ඝාතක ආඥා පනත ආදි පනත් මගින් පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම සඳහා මහජන සෞඛ්‍යයට අදාල කරුණු සම්බන්ධයෙන් වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී , ඒ ප්‍රාදේශීය සභාව, එහි සීමා ඇතුළත වූ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විමසා ක්‍රියාත්මක කළ යුතු බවත් එවැනි සියලු කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් දීම ද මහජන සෞඛ්‍යයට අදාළ කටයුතු ඒ ප්‍රදේශය තුළ කරගෙන යාම විධාන කිරීම හා අධීක්ෂණය ද ඒ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයාගේ වගකීම විය යුතු බවත් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ iv

වන කොටස 78(1) හා (2)වගන්තිය ප්‍රකාරව සඳහන් වී ඇති බැවින් මෙකී කාර්යය නෛතිකව ඉටු කර ගැනීම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ඇතුලු කාර්ය මණ්ඩලය සභාවට අයත් කාර්ය මණ්ඩලයක් ලෙස සලකා කටයුතු කිරීම සුදුසු බව යෝජනා කරන අතර පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් යොමු කරන ලද PL/10/04/01/20221(sub) හා 2021.11.19 දිනැති ලිපිය මගින් දන්වා ඇති පරිදි පහත සඳහන් පරිදි ප්‍රාදේශීය සභා පනතට යෝජිත සංශෝධන (216 හා 226 වගන්ති ) අනුව

01. මහජන සෞඛ්‍යයට අදාළ එහි නෛතික බලතල ප්‍රදේශයේ මහජන සෞඛ්‍යයට අදාළව එහි නෛතික බලතල ප්‍රදේශයේ අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා වෙත පැවරීම ප්‍රාදේශීය සභාවට නීත්‍යානුකූල වේ.

02. ප්‍රාදේශීය සභා පනතේ **සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී** යන්නෙන් අදහස් වන්නේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ නම් කරන ලද සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ අතිරේක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තනතුරට පත් කරන ලද ඕනෑම නිලධාරියෙකු හෝ එම තනතුරේ සේවය කරන ඕනෑම වෛද්‍ය නිලධාරියෙකු වේ.

යන සංශෝධනයන් පිළිගැනීම සුදුසු ද නොමැති ද යන තීරණය කිරීම සුදුසු බවත් ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ඇතුළු කාර්ය මණ්ඩලය සභාවට අයත් කාර්ය මණ්ඩලයක් ලෙස සලකා කටයුතු කිරීම සුදුසු බවත් ප්‍රාදේශීය සභා පනතට සිදු කිරීමට අපේක්ෂිත සංශෝධන පිළි නොගැනීම සුදුසු බවටත් වූ යෝජනාව සඳහා අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 12**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

ඌව පළාත් සභාවේ සංචාරක අමාත්‍යාංශය මගින් යොමු කරන ලද 2022-01-27 දිනැති 6/සං/8/TADP – 1 අංක දරණ ලිපිය ප්‍රකාරව හපුතලේ සංචාරක කලාපය තුල සංචාරක තොරතුරු මධ්‍යස්ථානයක් සහ සුවපහසු මධ්‍යස්ථානයක් ඉදි කිරීම ට අදාලව ආගරපතන වතු සමාගමට අයත් හපුතලේ කහගල්ල වත්තෙ හි සැළසුම් කර ඇති කොටසේ එකී සංචාරක තොරතුරු මධ්‍යස්ථානය සහ සුවපහසු මධ්‍යස්ථානය ඉදි කිරීමේ ව්‍යාපෘතියේ සුවිශේෂීභාවය සලකා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මෙකී ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමෙන් පසු පාලනය හා පරිපාලනය හපුතලේ ප්‍රාදේශීය සභාවට පැවරීමේ එකඟතාවයට යටත්ව නිර්දේශය ලබා දීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා

විවාද

ඌව පළාත් සභාවේ සංචාරක අමාත්‍යාංශය මගින් යොමු කරන ලද 2022-01-27 දිනැති 6/සං/8/TADP – 1 අංක දරණ ලිපිය ප්‍රකාරව හපුතලේ සංචාරක කලාපය තුල සංචාරක තොරතුරු මධ්‍යස්ථානයක් සහ සුවපහසු මධ්‍යස්ථානයක් ඉදි කිරීම ට අදාලව ආගරපතන වතු සමාගමට අයත් හපුතලේ කහගල්ල වත්තෙ හි සැළසුම් කර ඇති කොටසේ එකී සංචාරක තොරතුරු මධ්‍යස්ථානය සහ සුවපහසු මධ්‍යස්ථානය ඉදි කිරීමේ ව්‍යාපෘතියේ සුවිශේෂීභාවය සලකා ව්‍යාපෘතිය ඉදි කිරීමෙන් පසු පාලනය හා පරිපාලන කටයුතු හපුතලේ ප්‍රාදේශීය සභාවට පැවරීමේ පදනම මත ඒ සඳහා නිර්දේශය ලබා දීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

මින් පෙර නාය යාමට ලක් වූ ස්ථානයක් බැවින් විශාල පරිමාණයේ ගොඩනැගිලි ඇතුලත් නොකර ඉතා ලස්සන උද්‍යානයක් ලෙස ආදායම් උත්පාදන සඳහා සංචාරක ආකර්ෂණය දිනාගැනීම අරමුණු කර ගනිමින් එම ස්ථානය සුදුසු පරිදි ඉදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස හපුතලේ ආසන සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තිස්ස කුට්ටි ආරච්චි මැතිතුමා මෙකී යෝජනාව දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට යොමු කරන ලෙස පවසා සිටි බව ගරු සභාපතිතුමන් විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## යෝජනා අංක 13

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යපෘතිය - යටතේ ප්‍රමුඛතාගත කරන ලද උප ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යාමේ දී එම ඉඩම් වල අයිතිය සභාව සතු නොවීම සහ ව්‍යාපෘති නිර්ණායකවලට අනුකූල නොවීම හේතුවෙන් LDSP ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ LAPDP සැලසුමට ඇතුළත් කර සංශෝධනය කිරීම සුදුසු බවත් එකී පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට අවශ්‍ය අනුමැතිය ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගෙන් ලබා ගැනීමටත් එසේ කටයුතු සිදු කිරීමෙන් පසුව LDSP ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ එකී සංවර්ධන යෝජනාව ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා

විවාද

ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යපෘතිය - LDSP ව්‍යාපෘතිය යටතේ ප්‍රමුඛතාගත කරන ලද උප ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යාමේ දී එම ඉඩම් වල අයිතිය සභාව සතු නොවීම සහ ව්‍යාපෘති නිර්ණායකවලට අනුකූල නොවීම හේතුවෙන් LDSP ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ LAPDP

සැලසුම තුළ ඇතුළත්ව නැති හපුතලේ ප්‍රාදේශීය සභාව සතු පැරණි ගම් සභා ගොඩනැගිල්ල කඩා ඉවත් කර බහුකාර්ය ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ යෝජනාව LAPDP සැලසුමට ඇතුලත් කර සංශෝධනය කිරීම සුදුසු බවත් ඒ අනුව LDSP ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ එකී සංවර්ධන යෝජනාව ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී. එසේම මෙම පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය පළාත් පාලන කොමසාරිස් මගින් ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලබා ගත යුතු බවද ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 14**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය සභාව මගින් සකසනු ලබන වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල 2012 වර්ෂයටත් පෙර සිට නිශ්චිතව හඳුනා ගත නොහැකි හිඟ හිටි වෙනත් ආදායම් ලෙස රු.389,982.86 ක මුදලක් පෙන්නුම් කරන බවත් මෙකී හිඟ ආදායම ගෙවීමට හෝ අයකර ගැනීමට වගකිව යුතු පුද්ගලයෙකු හෝ ආයතනයක් පරිශ්‍රයක් සොයා ගත හැකි කිසිඳු ලේඛනයක් හෝ ගොනුවක් හපුතලේ ප්‍රාදේශීය සභාව සතුව නොමැති හෙයින් හා මෙකී හිඟ ආදායම ගිණුම තුලනය කිරීම සඳහා අතීතයේ යෙදූ බව නිරීක්ෂණය වන බැවින් මේ සම්බන්ධයෙන් සවිස්තරාත්මක වාර්තාවක් යොමු කරන ලද අභ්‍යන්තර විගණන කමිටුවේ නිර්දේශයද පදනම් කර ගෙන එකී ලැබිය යුතු යැයි සඳහන් වන හිඟ මුදල වන රු.389,982.86 ක මුදල ගරු ආණ්ඩුකාරතුමන්ගේ පූර්ව අනුමැතිය මත පොත්වලින් කපා හැරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා

විවාද

හපුතලේ ප්‍රාදේශීය සභාව මගින් සකසනු ලබන වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල 2012 වර්ෂයටත් පෙර සිට නිශ්චිතව හඳුනා ගත නොහැකි හිඟ හිටි වෙනත් ආදායම් ලෙස රු.389,982.86 ක මුදලක් පෙන්නුම් කරන බවත් මෙකී හිඟ ආදායම ගෙවීමට හෝ අයකර ගැනීමට වගකිව යුතු පුද්ගලයෙකු හෝ ආයතනයක් පරිශ්‍රයක් සොයා ගත හැකි කිසිඳු ලේඛනයක් හෝ ගොනුවක් හපුතලේ ප්‍රාදේශීය සභාව සතුව නොමැති හෙයින් හා මෙකී හිඟ ආදායම ගිණුම තුලනය කිරීම සඳහා අතීතයේ යෙදූ බව නිරීක්ෂණය වන බැවින් මේ සම්බන්ධයෙන් සවිස්තරාත්මක වාර්තාවක් යොමු කරන ලද අභ්‍යන්තර විගණන කමිටුවේ නිර්දේශයද පදනම් කර ගෙන එකී ලැබිය යුතු යැයි සඳහන් වන හිඟ මුදල වන රු.389,982.86 ක මුදල ගරු ආණ්ඩුකාරතුමන්ගේ පූර්ව අනුමැතිය මත පොත්වලින් කපා හැරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා**</u>

<u>ඉදිරිපත් කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මහතා</u>

බ/ ජනානන්ද ජාතික පාසලේ සුහුරු පන්ති කාමරයේ (Smart Class Room)වැඩ කටයුතු නිම කිරීම සඳහා රු.150,000.00ක මුදලක් මූල්‍යාධාර ලෙස සභා අරමුදලෙන් ලබා දීම සුදුසු බවත් ඒ අනුව ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය ලබා ගෙන අදාල වියදම් දැරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා</u>

<u>විවාද</u>

බ/ ජනානන්ද ජාතික පාසලේ සුහුරු පන්ති කාමරයේ (Smart Class Room)වැඩ කටයුතු නිම කිරීම සඳහා රු.150,000.00ක මුදලක් මූල්‍යාධාර ලෙස සභා අරමුදලෙන් ලබා දීම සුදුසු බවත් ඒ අනුව ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය ලබා ගෙන අදාල වියදම් දැරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

### 06. කාරක සභා වර්තාව

2022.02.03 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තා සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

### 07. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ

2022 ජනවාරි  මස ලැබීම් හා වියදම් පිළිබඳ මාසික වාර්තාව සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

### 08.වෙනත් කරුණු

### 08.i මන්ත්‍රී මණ්ඩලයේ නිවාඩු අනුමත කිරීම.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. එම්. විමලසිරි මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. එල්.සුදර්ශන මහතා සහ  ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ප්‍රැන්සිස් වයලට් රෝස් මහත්මිය අසනීප නිවාඩු ලබා ඇති බැවින් 2022-02-11 වන දින සභාවට සහභාගී නොවීම සම්බන්ධයෙන් ගරු සභාව විසින් එකී සභිකයන් හට අසනීප  නිවාඩු ලබා දීම සුදුසු බවට එකඟතාවය පළ කරන ලදී.

**08.ii ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීම.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා අදහස් දක්වමින් පසුගිය දිනක තම කොට්ඨාසය තුළ මළ ගෙයක් සිදු වූ බවත් එම නිවස අසළ මාර්ගයේ වීථි ලාම්පුව ක්‍රියාත්මක නොවූ බැවින් හපුතලේ ප්‍රාදේශීය සභාවෙ හි විදුලි කාර්මික කටයුතු හි නිරත වන පුද්ගලයාහට ඒ පිළිබඳව දැන්වුව ද එකී කටයුත්ත සොයා බලා සිදු කර නොදීම හේතුවෙන් තමා දැඩි අපහසුතාවයට ලක් වූ බව ප්‍රකාශ කරන ලදී.දිගින් දිගටම සිදු වන මෙවැනි වගකීම් විරහිත ක්‍රියා හේතුවෙන් හපුතලේ ප්‍රාදේශීය සභාවෙ හි විදුලි කාර්මික කටයුතු හි නිරත වන පුද්ගලයා එකී සේවයට අයත් කම්කරුවෙකු නොවේ නම් ඔහු එම කටයුතු වලින් ඉවත් කර ඔහුට අදාල සේවයේ පිහිටුවන ලෙසත් , මෙකී කටයුතු සඳහා සුදුසු පුද්ගලයකු කොන්ත්‍රාත් ක්‍රමයට හෝ හපුතලේ ප්‍රාදේශීය සභාව සඳහා බඳවා ගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ගෝපාලන් මුරුගන් මහතා අදහස් දක්වමින් පසුගිය අයවැය ප්‍රතිපත්තිය මත ගෝඨාභය ජනාධිපතිතුමන්ගේ සංකල්පයක් මත බඳවා ගත් රැකියා ලක්ෂයට අයත් පුද්ගලයන්ගෙන් 10 දෙනෙකු හෝ සභාවට අනුයුක්ත කර ගැනීමට කටයුතු සිදු කිරීම සුදුසු ය යන්න ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් එකී රැකියා සඳහා කම්කරුවන් ලෙස බඳවා ගෙන ඇති බවත් විදුලි කාර්මික නිලධාරියෙක් ඒ යටතේ අනුයුක්ත කර ගත නොහැකි බවත් මේ යටතේ කම්කරුවන් හෝ සභාව වෙත බඳවා ගත හැකි නම් ඒ සම්බන්ධයෙන් අදාළ බලධාරීන් සමඟ ඉදිරියේ දී සාකච්ඡා සිදු කිරීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එල්.එච්. ඉන්දික සම්පත් මහතා අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි සීගිරි ලංකා ඒකනායක මහතා වීථි පහන් සවි කිරීම පිළිබඳ දැක්වූ අදහසට තමාද එකඟවන බවත් වීථි පහන් අක්‍රිය වීම සම්බන්ධයෙන් කිහිපවිටකදීම එකී කටයුතුවල නියැලෙන පුද්ගලයාට දැනුම් දීම් සිදු කලද ඒ සඳහා කිසිදු ප්‍රතිචාරයක් නොලැබෙන බවත් හපුතලේ ප්‍රාදේශීය සභාවෙ හි කාර්මික කටයුතු හි නිරත වන පුද්ගලයා එකී සේවයට අයත් කම්කරුවෙකු නොවේ නම් ඔහු එම කටයුතු වලින් ඉවත් කර ඔහුට අදාල සේවයේ පිහිටුවන ලෙසත් , මෙකී කටයුතු සඳහා සුදුසු පුද්ගලයකු හපුතලේ ප්‍රාදේශීය සභාව සඳහා බඳවා ගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලදී.
එසේම විහාරකැලේ සුසාන භූමියෙ හි කටයුතු සම්බන්ධයෙන් නිසි නඩත්තු කිරීමේ ක්‍රමවේදයක් අවශ්‍ය බවත් මිනී වළ දැමීමේ දී නිසි ක්‍රමවේදයක් අනුගමනය නොකරන බැවින් ඒ සඳහා සභාව මැදිහත් වී නිසි ක්‍රමවේදයක් සැකසිය යුතු බවත් පාලන කටයුතු සභාව හරහා සිදු කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් විහාරකැලේ පොදු සුසාන භූමිය අධීක්ෂණය කිරීම සඳහා සභාපති ,මහජන නියෝජිතයන් පිරිසක් , ලේකම් , කාර්මික නිලධාරිතුමන් මැදිහත් වී පරීක්ෂණයක් සිදු කර මැනුම් කටයුතු සිදු කර නිසි පරිදි නඩත්තු කිරීමේ ක්‍රමවේදයක් සකසන බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ලියෝ කැමිලස් ප්‍රනාන්දු මහතා අදහස් දක්වමින් දියතලාව මහ විද්‍යාලයේ පිට්ටනිය කැපීමේ දී වර්ෂාව හේතුවෙන් පස් පාර හරහා පහත් ප්‍රදේශයේ ඇති නිවාස වලට හා මාර්ගවලට සේදී යාම නිසා ප්‍රදේශයේ ජනතාව අසීරුතාවයට පත් වී ඇති බවත් ඒ සම්බන්ධෙයන් නිවැසියන්හට දොස් නගා ඇති බවත් මෙයට පහත් ප්‍රදේශයේ ජීවත් වන නිවැසියන් වැරදිකාරයන් නොව වර්ෂාව හේතුවෙන් පස් ජලය සමඟ සේදී යාම මෙයට හේතුව බවත් පෙර සිට මෙම ගැටලුව පැවති බවත් ඒ අවස්ථාවේ දී තමා මැදිහත් වී එකී කාණු පද්ධතිය සැකසූ බවත් මින් පෙර අවස්ථායකදී ද තමා පිට්ටනිය ඉදි කිරීම සඳහා මුදල් වෙන් කර ගත් බවත් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් බැම්මක් නොමැති වීම හේතුවෙන් පිට්ටනිය සංවර්ධනය කිරීම සඳහා අවසර ලබා නොදුන් බවත් බැම්මක් නොමැතිව පිට්ටනිය සංවර්ධනය කිරීම සිදු කළ හොත් පහත් ප්‍රදේශයේ ඇති පොලිස්කන්ද යාය , කොස්කොටේ අරාවයාය, බුලත්වැල්යාය කුඹුරු අක්කර 100ක් පමණ මේ හේතුවෙන් යටවන බවත් එකී වාර්තාවේ සඳහන් කර ඇති බවත් , දැන් මෙම සංවර්ධන කටයුතු සිදු කරන්නේ කෙසේ දැයි ප්‍රකාශ කරන ලදී.එසේම 2018 වර්ෂයේදී ළඟම පාසල හොඳම පාසල වැඩසටහන යටතේ පිට්ටනිය ලබා ගැනීමට මූලිකව කටයුතු සිදු කළ බවත් මේ වන විට අක්‍රමිකවත් ලෙස පස් කැපීම හේතුවෙන් පස් රොක් වීම හේතුවෙන් ප්‍රදේශයේ ජනතාව බොහෝ සෙයින් අසීරුතාවයට පත් වී ඇති බවත් එකී කටයුතු සිදු කිරීමේ දී සිදු වන අපහසුතාවය වළක්වා ගැනීමට කොන්ත්‍රාත්කරු මාර්ගයෙන් හෝ පියවර ගැනීමට කටයුතු කරන ලෙසත් නොඑසේ නම් මෙම සංවර්ධන කටයුතු සඳහා විරුද්ධතාවයක් ප්‍රකාශ නොකල බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් විදුහල්පතිතුමා ඇතුලු ඊට අදාල සියලු පාර්ශව සභාව වෙත කැඳවා ඒ සම්බන්ධයෙන් සාකච්ඡාවක් සිදු කළ බවත් විදුහල්පතිතුමා මේ සම්බන්ධයෙන් අදහස් දැක්වීමේ දී එකී ඉඩම පිට්ටනිය ඉදි කිරීම සඳහා මේ වන තෙක් රඳවා ගෙන තිබූ බවත් පහත් ප්‍රදේශයේ වෙසෙන ජනතාව විසින් කාණු පද්ධතිය වසා ඇති බවත් අනවසර ලෙස ඉදි කිරීම් සිදු කර ඇති බවත් , එකී සාකච්ඡාවේ දී කාර්මික නිලධාරිතුමන් වෙන්වෙන් ව අදාල පාර්ශව වෙත පෙන්වා දුන් බවත් , කාණු පද්ධතිය නොමැති වීම හේතුවෙන් ක්‍රීඩා පිටිය ඉදි කර අවසන් වන තෙක් අපහසුතා මධ්‍යයේ හෝ මෙම ගැටලුවට මුහුණ දීමට සිදු වන බවත් සංවර්ධන කටයතු අවසන් වූ පසු වෙන් වී ඇති ප්‍රතිපාදන මත කාණුව ඉදි කර මෙකී ගැටලුව මඟ හරවා ගැනීමට කටයුතු කරන බව විදුහල්පතිතුමන් එකී සාකච්ඡාවේ දී සඳහන් කළ බවත් ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා අදහස් දක්වමින් සියලු පරීක්ෂණ වලට යටත්ව මෙකී සංවර්ධන කටයුතු සිදු වන බවත් මේ වන විට බොහෝ සෙයින් වැඩ නිම වී ඇති බවත් ඉතා සුලු කාලයක් තුළ මෙකී ගැටලු මඟ හරවා ගත හැකි බවත් සිදු වන අපහසුතාවය වළක්වා ගැනීමට කොන්ත්‍රාත්කරු මාර්ගයෙන් හෝ පියවර ගැනීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.සුදත් අරුණ රංජන මහතා අදහස් දක්වමින් මෙකී පිට්ටනියේ මැනුම් කටයුතු සඳහා තම දායකත්වය ලබා දුන් බවත් මුල් අවධියේදී මීටර 400 ධාවන පථයක් සහිතව ඉදි කිරීමට සූදානමක් තිබූ බවත් ඒ සඳහා ඉඩ ප්‍රමාණවත් නොවූ බැවින් වෙන් වී ඇති ප්‍රතිපාදන මත පිට්ටනිය ඉදි කිරීම සිදු කළ බවත් පිට්ටනිය කපා අවසන් කිරීමට පෙර බැම්මක් සෑදීම සිදු කළ

හොත් ඉදි කිරීම් කටයුතු සඳහා බාධාවක් මතුවේය යන්න මත මෙලෙස කටයුතු කළ බවත් අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන මත බැම්මක් බැඳීම සිදු කරන බවත් තමා දැනුවත් බව ප්‍රකාශ කරන ලදී.

ගරු උපසභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා විසින් අදහස් දක්වමින් මෙකී සියලු ඉඩම්වල හිමිකාරීත්වය සම්බන්ධයෙන් තමා දැනුවත් බවත් ජනාධිපතිතුමන් විසින් ප්‍රතිපාදන වෙන් කරන ලද්දේ ආසන සංවිධායක ගරු තිස්ස කුට්ටිආරච්චි මැතිතුමා වෙත බවත් ප්‍රාදේශීය ජනතාවට සිදු වන අපහසුතාවය වළක්වා ගැනීම සඳහා සභාව මැදිහත් වී හෝ පස් කොට්ට යොදා බෝක්කුව සුද්ධ කිරීම සිදු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. ප්‍රභාගර් මහතා අදහස් දක්වමින් කොවිඩ් -19 වසංගතය හමුවේ මුඛ ආවරණ භාවිතයත් සමඟ ඉවත් කරනු ලබන මුඛ ආවරණ භාවිතයෙන් පසු පාර දෙපස ඉවත් කරන බැවින් මාර්ග දෙපස බොහෝ සෙයින් මුඛ ආවරණ එකතු වී ඇති බවත් ඇතැම් වතු ප්‍රජාව විසින් මෙසේ ඉවත් කරන මුඛ ආවරණ නැවත භාවිතා කරනු ලබන බවත් මේ සම්බන්ධයෙන් වතු ආශ්‍රිත ප්‍රජාව දැනුවත් කරන ලෙස මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු සිදු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.
කහගල්ල ඇතුලු වතු ආශ්‍රිත ප්‍රදේශයන් හි ඩෙංගු ව්‍යාප්තිය වැඩි වී ඇති බවත් ප්‍රජාව විසින් මත්පැන් භාවිතයෙන් පසු එම බෝතල් පාර දෙපස විසි කිරීම සිදු කරන බවත් මේ සම්බන්ධයෙන් සිවිල් ආරක්ෂක කමිටුවේ සාමාජිකයන් දෙදෙනෙකු දිනපතා යෙදවීම තුළින් මේ සඳහා යම් කිසි විසඳුමක් ලබා ගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී.
හපුතලේ බල ප්‍රදේශයේ පිහිටි වෙනත් වතුයායන් හි නොමැති අවස්ථාවක් දඹේතැන්න වතු යායට හිමි වී ඇති බවත් එම අවස්ථාව වන ලිප්ටන් ශීට් හි පාලනය හපුතලේ ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමෙන් අනාගතයේ දී එහි අයිතිය සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයක් උද්ගත වන බවත් මේ සඳහා එකී කටයුතු අධීක්ෂණය සඳහා පමණක් සභාව මැදිහත් වීම සුදුසු බවත් මේ සම්බන්ධයෙන් දඹේතැන්න වතු අධිකාරි සමඟ ගරු සභාපතිතුමන් ගරු මන්ත්‍රී මණ්ඩලයේ නියෝජනයක් ආදි කමිටුවක් සම්බන්ධවී සාකච්ඡාවක් සිදු කිරීම සුදුසු බවත් සභාවට පවරා ගැනීමේ තීරණය සම්බන්ධයෙන් තම විරුද්ධත්වය ප්‍රකාශ කරන බවත් සඳහන් කරන ලදී.

ගරු සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් ලිප්ටන් ශීට් හි ප්‍රවේශ ගාස්තු ලෙස රු.500.00ක මුදලක් අය කරන බවත් වර්ෂයක් පසා මෙම මුදල වැඩි කිරීමට එකී පුද්ගලයන් කටයුතු සිදු කරන බවත් එවිට විදේශ සංචාරකයන්ගේ පැමිණීම අඩු වීමෙන් ප්‍රදේශයේ ඒ අශ්‍රිතව බිහි වී ඇති ආදායම් උත්පාදන මාර්ග සියල්ලම අහිමි වී යන බවත් ප්‍රකාශ කළ අතර ප්‍රාදේශීය සභා පනතෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව ආදායම් උත්පාදනය කරනු ලබන ආයතනයන් මගින් සභාවට කුලී මුදල් අයකර යුතු බවත් මේ වන විටත් සංචාරක ක්ෂේත්‍රය අශ්‍රිත ව්‍යාපාරික ස්ථානවලින් කුලී මුදල් අය කර ගන්නා බවත් නොඑසේ නම් එම ස්ථානය මුද්‍රා තැබීමට පවා සභාවට හැකියාව ඇති බවත් බදු මුදල් අය කිරීම අනිවාර්ය බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. සගාදේවන් මහතා මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් වතුවලින් අක්කර බදු අය කරන්නේ නම් ලිපටන් ශීට්වලින් ද බදු කුලී අය කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. ප්‍රභාගර් මහතා අදහස් දක්වමින් ලිප්ටන් ෂීට් හි ඇති අලෙවිසැල වෙනුවට සභාව හරහා අලෙවිසැල් ප්‍රමාණය වැඩි කිරීම සුදුසු බවත් කහගල්ල නැරඹුම් මධ්‍යස්ථානයේ ද අලෙවිසැල් ආරම්භ කිරීම සුදුසු බවත් ප්‍රකාශ කළ අතර ගරු සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් මැයි මස සිට මීට අදාල සියලු කටයුතු ආරම්භ කල යුතු බවත් කහගල්ල නැරඹුම් මධ්‍යස්ථානයේ අලෙවිසැල් ආරම්භ කිරීම සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා සිදු කර ඒ සඳහා කටයුතු ආරම්භ කිරීම සිදු කරන බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. සගාදේවන් මහතා අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සීගිරි ලංකා ඒකනායක මහතා වීථි ලාම්පු සම්බන්ධයෙන් දැක්වූ අදහස මෙන්ම හපුතලේ සභාවට අයත් බැකෝ රථ රියදුරු ද නිසි පරිදි අවශ්‍ය වේලාවට සේවා සැපයීම සිදු නොකරන බවත් ප්‍රකාශ කල අතර නො-01 වතුයායේ ලිප්ටන් ෂීට් තංගමලේ වත්තේ හි සංදේශ කුළුණ මගින් කොපමණ ආදායමක් හිමි වනවාද යන්න සොයා බැලිය යුතු බවත් ඇඩිසම් හංදියේ පිහිටා ඇති කඩය මේ වන විට වසා ඇති බවත් මේ සම්බන්ධයෙන් වතු අධිකාරිතුමන් කිහිප විටකදී දැනුවත් කළද ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක නොවුන බවත් නැවත වරක් සභාව මැදිහත් වී වතු අධිකාරි දැනුවත් කර වර්තමානය වන විට සංචාරක කර්මාන්තය ආරම්භ වූ බැවින් එකී කඩය විවෘත කිරීම සඳහා කටයුතු සිදු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් ග්ලැන්නෝර් වත්තෙ හි රෝහල සම්බන්ධයෙන් කටයුතු කල වෛද්‍ය නිලධරිතුමන් අසනීප වී ඇති බැවින් මෙම දිනයන්හි එකී රෝහලෙහි වෛද්‍යවරයෙකු නොමැති බවත් වතු හි සේවය කරනු ලබන ප්‍රජාව වතු සේවය නිමා වී සවස 5.30ට පමණ ඖෂධ ලබා ගැනීම සඳහා වෙනත් දිනවල ගියද මේ වන විට රෝහල් හි පවතින වෛද්‍ය හිඟය හේතුවෙන් ප්‍රතිකාර කිරීම නිසි පරිදි සිදු නොවන බවත් රෝගීන් හට දියතලාව මූලික රෝහල වෙත ඒමට සිදු වන බවත් ප්‍රජාව දැඩි අපහසුතාවයට ලක් වී ඇති බවත්, ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය අධිකාරි දැනුවත් කරන ලෙසත් තංගමලේ, බෝවත්ත වත්තෙ හි මෙන්ම පිටරත්මලේ වත්තෙහි ද වෛද්‍ය හිඟය හා ගැටලු පවතින බැවින් රෝගී ජනතාව දැඩි අපහසුතාවයට ලක් වන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. සගාදේවන් මහතා අදහස් දක්වමින් 2018 වර්ෂයේ ආරම්භ කළ ග්ලැනනෝර් වත්තෙ හි ඉන්දියන් රජයෙන් ආරම්භ කළ නිවාස 100 ව්‍යාපෘතිය පසුගිය මස 16 වෙනිදා ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා ,ගරු ජීවන් තොණ්ඩමන් මහතාගේ ප්‍රධානත්වයෙන් වතු ජනතාවට යතුරු භාර දුන් බවත් ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ප්‍රතිපාදන වෙන් කළ අතර ගරු ජීවන් තොණ්ඩමන් මහතාගේ ප්‍රතිපාදන මත එකී නිවාසවල යටිතල පහසුකම් මාර්ගය, විදුලිය , ජලය ලබා ගැනීමට ඉදිරි කටයුතු සිදු කළ යුතු බවත් මෙකී නිවාස ව්‍යාපෘතිය ප්‍රජාවට ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිය පළ කරමින් ලිපියක් යොමු කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් මේ වන විට සමෘද්ධිලාභීන් 87 දෙනෙකු පමණ තෝරා ගෙන ඇති බවත් 20-25 දෙනෙකුට පමණක් මේ වන විට විදුලිය ලැබී ඇති බවත් ප්‍රකාශ කළ අතර ජනාධිපතිතුමන්ගේ ප්‍රතිපාදන මත නොමිලේ විදුලිය ලැබෙනවා යැයි

පැවසුවද මේ වන විට කිසියම් මුදලක් අය කරන බවට තොරතුරු ලැබී ඇති බව ප්‍රකාශ කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. සගාදේවන් මහතා අදහස් දක්වමින් විදුලිය සම්පූර්ණයෙන් ම නොමිලේ හිමි වන බව ප්‍රකාශ කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මාරපන් කන්දසාමි මහතා අදහස් දක්වමින් හපුතලේ බල ප්‍රදේශය තුළ පිහිටි ග්‍රාම සේවා වසම් අතර හොඳම ග්‍රාම නිලධාරී කාර්යාල තෝරා සම්මාන දී ඇති බවත් එහිදී පළමු ස්ථානයට පත් වී ඇත්තේ දඹේතැන්න ග්‍රාම නිලධාරී කාර්යාලය බවත් දෙවන ස්ථානය හා තෙවන ස්ථානය ලබා ගත්තේ කුමන ග්‍රාම නිලධාරී කාර්යාලයද යන්න සොයා බලා සභාව හරහා ඇගයීමක් සිදු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.
එසේම මේ දිනවල දුරකථන ජාලා හරහා වතු ජනතාවගේ ජංගම දුරකථන වලට තරඟයකින් දිනා ඇති බවට ඇමතුමක් ලැබෙන බවත් මෙම ජයග්‍රහණය වෙනුවෙන් රුලක්ෂ 08 ක් දිනා ඇති බවට සඳහන් කරන අතර මෙම මුදල ලබා ගැනීමට රු.125,000.00ක මුදලක් ඊෂි - කෑෂ් ක්‍රමයට ගෙවන ලෙසත් එම කෙටි පණිවුඩය පෙන්වා අදාල මුදල ලංකා බැංකුවෙන් ලබා ගන්නා ලෙසත් අදාල ගනදෙනුකරු විසින් ප්‍රකාශ කරන අතර බොහෝ පිරිසක් මේ වන විට මෙම වංචාවට හසු වී මුදල් ගෙවා ඇති බවත් වංචාවට හසු වූ පිරිස් මේ පිළිබඳව වෙනත් පාර්ශවයකට පවසන්නේ සියල්ල හමාර වූ පසු බවත් මේ සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීමට කටයුතු සිදු කළ යුතු බවට ප්‍රකාශ කරන ලදී. එසේ ම මෙම වංචාකාර පුද්ගලයින් පිළිබඳව සොයා බලා නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු සිදු කළ යුතු බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මාරප්පන් කන්දසාමි මහතා මෙසේ අදහස් දැක්වූයේ එකී ගැටලුවට බොහෝ සෙයින් මුහුණ දී ඇත්තේ වතු ප්‍රජාව බවත් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු ලෙස මෙම ගැටලුව සභාවට ඉදිරිපත් කළේ කුමන් හෝ විසඳුමක් ලබා ගැනීමට බවත් , මේ සම්බන්ධයෙන් අපහාස නොකරන ලෙසත් මේ සම්බන්ධයෙන් දැඩි ක්‍රියාමාර්ග ගත යුතු බවත් වංචාකාර පුද්ගලයින් සම්බන්ධයෙන් සොයා බලා නීතිමය පියවර ගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා වැඩිදුරටත් අදහස් දක්වමින් මෙම දිනයන් හි වතු ප්‍රජාව බෙහෙවින් කණ්ඩායම් ණය මුදල් ලබා ගැනීමට පෙළඹී ඇති බවත් ඒ හේතුවෙන් බොහෝ අපහසුතාවයට ලක් වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

මිනිසුන් මුලා කරමින් මුදල් වංචා කිරීමේ විවිධ අකටයුතුකම් සිදු වන බවත් මිනිසුන් මුලාවට පත් වී එකී පුද්ගලයින් විසින් ලබා දෙනු ලබන බැංකු ගිණුම් සඳහා මුදල් තැම්පත් කර වංචාවට හසු වී ඇති බවත් ප්‍රකාශ කළ අතර මේ සම්බන්ධයෙන් සොයා බලා එකී අකටයුතුකම් වැළැක්වීම සම්බන්ධයෙන් පියවර ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් මෙවැනි ජාවරමක් මේ දින වල ක්‍රියාත්මක වන බවත් බොහෝ මිනිසුන් ප්‍රමාණයක් මේ වන විට මෙම ජාවාරමට හසු වී ඇති බවත් තමතමන්ගේ මුදල් නාස්ති කර ගෙන ඇති බවත් මේ සම්බන්ධයෙන් පොලීසිය හෝ දැනුවත් කිරීම සිදු කළ යුතු බවත් ශබ්දවිකාශන යන්ත්‍ර මගින් හා සමජ මාධ්‍ය ජාලා භාවිතා කර ප්‍රජාව දැනුවත් කිරීමට කටයුතු සිදු කරන බවත් ප්‍රකාශ කරන ලදී

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් මෙම ජාවාරමට මිනිසුන් බොහෝ ප්‍රමාණයක් මේ වන විට හසු වී ඇති බවත් තම මුදල් වංචා වූ පසු කිසිම පාර්ශවයකට ඒ පිළිබඳව නොදන්වා සඟවා සිටින බවත් ප්‍රකාශ කළ අතර මේ පිළිබඳව හපුතලේ පොලිස් ස්ථානාධිපති හෝ දැනුවත් කර වංචා සිදු කරන පුද්ගලයින් නීතිය හමුවට ගෙන ඒම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන මෙන් ප්‍රකාශ කරන ලදී.

මෙදින සභා රැස්වීම ප.ව.12.00ට අවසන් විය.

බී. කන්දසාමි,
සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව.